**තණමල්විල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 95 ක් සහ මොරකැටිය හංදියේ පිහිටි කඩකාමර සහිත ඉඩම තක්සේරු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | නිවරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම දේපල තක්සේරු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කරන බව දන්වමි. |
| (ii) | 2019 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග ලෙසට ලැබී තිබුණු රු. 6,009,602 ක් වටිනා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් ප්‍රාග්ධන ආදායම් ගිණුමට සහ ප්‍රාග්ධන වැය ගිණුමට සටහන්කර නොතිබුණු බැවින් එම ගිණුම්වල ශේෂයන් රු. 6,009,602 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජ්නල් සටහන් මගින් ගැලපුම් කරන බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. 1,083,100 ක ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් ලෙස දක්වා තිබුණි. | නිවරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී මෙවන් වැරදි සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. |

**(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------------ | --------------- | ------------------ |
| රු. 1,687,057,688 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සඳහා තක්සේරු වාර්තා සහ අයිතිය තහවුරු කිරීමේ ලියවිලිද රු.6,999,974 ක් වූ ලී බඩු සහ සවිකිරීම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනද විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී පිළිගත් තක්සේරුකරුවන්ගේ වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බවද, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරන බවද දන්වමි. |

**1.4 <u>අනුකූල නොවීම්</u>**

**<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ---------------------- | ----------------- | ------------- | ------------------------ |
| **(අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | | | |
| (i) 134(1) වගන්තිය | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන සිතියම් ගතකොට ඇති බවද, මොනරාගල සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ii) 147(1) හා 149 වගන්ති | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය අනුමත කර ඇති සභා බලප්‍රදේශයේ තිබෙන හෝටල් සහ නවාතැන් පොළ 3 කින් ගාස්තු අයකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | බදු අයකරගෙන නොමැති ආයතනවලින් 2018 සහ 2019 වර්ෂ සඳහා අයකළ යුතු ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි. |
| (iii)126(vii) වගන්තිය | අතුරු ව්‍යවස්ථා පනවා රථ වාහන නැවතුම් ස්ථාන වලින් ගාස්තු අයකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් ප්‍රාදේශීය සභා සඳහා අතුරු ව්‍යවස්ථා |

| | | | |
|---|---|---|---|
| | | | කෙටුම්පත් කිරීම සිදුකළ අතර එම කාර්ය අවසන් වූ පසු ගාස්තු අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |
| **(ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය</u>** | | | |
| XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | 2014 වර්ෂයට පෙර සිට පැවත එන, සේවකයන් 16 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 124,147 ක සේවක ණය ශේෂය අයකරගෙන නොතිබුණි. | හිඟ සේවක ණය අය කිරීමට කටයුතු කළ යුතුවේ. | සේවක ණය පියවා ගැනීම සම්බන්ධයෙන් ලිපි යවා ඇති බවද පසු විපරම් කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |
| (ඇ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | සභාව විසින් 2014, 2015 සහ 2016 වර්ෂවල අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 62 ක් සඳහා අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි. | ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර අනුකූලතා සහතික නිකුත් කළ යුතුවේ. | අනුකූලතා සහතික ලබා ගැනීමට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දැනුවත් කළ බවද මේ දක්වා අයදුම්පත් ඉදිරිපත් කර නොමැති බව දන්වමි. |
| **(ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>** | | | |
| මු.රෙ. 571 | එකතුව රු. 466,491 ක් වූ තැන්පත් කර වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්මවූ තැන්පතු ශේෂ 28 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මු.රෙ 571 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කල් ඉකුත් වූ පොදු තැන්පත් ශේෂ ඉතා කඩිනමින් නියාදනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 25,423,503 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,363,166 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 35,000 | - | - | - | 60,000 | 35,000 | 35,000 | - |
| (ii) කුලී | 14,207,600 | 14,725,350 | 14,472,425 | 252,925 | 14,197,600 | 14,082,261 | 13,648,561 | 433,700 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,307,350 | 2,005,773 | 2,005,773 | - | 1,697,715 | 2,031,502 | 2,031,502 | - |
| (iv) වෙනත් ආදායම් | 134,015,293 | 32,700,068 | 22,738,792 | 9,961,277 | 16,627,443 | 17,032,249 | 4,201,336 | 12,830,913 |
| එකතුව | 150,565,243 | 49,431,191 | 39,216,990 | 10,214,202 | 32,582,758 | 33,181,012 | 19,916,399 | 13,264,613 |

### 2.2.2 දේපොළ බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් මස් කඩ, මාළු කඩ හා සතිපොල බදුදීම වෙනුවෙන් අයවිය යුතු වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙනඑමින් පවතින රු. 768,277 ක හිඟ බදු මුදල් අයකර ගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකරගත යුතුවේ. | හිඟ මුදල් කපා හැරීමට සහකාර පළාත් පාලන කොමසාරිස් මගින් ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඉල්ලීම් කර ඇති බව දන්වමි. |

### 2.2.3 යන්ත්‍රෝපකරණ කුලියට දීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් මෝටර් ග්‍රේඩරය, ගල් රෝල හා ටිපර් රථය කුලියටදීම වෙනුවෙන් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට අය නොවී පවතින රු. 610,912 ක හිඟ කුලී ආදායම් අයකර ගෙන නොතිබුණි. | හිඟ කුලී අයකරගත යුතුවේ. | මෙම මුදල් අයකර ගැනීමට වැල්ලවාය උසාවියේ නඩු පැවරීම සඳහා යොමුකර එන්තරවාසි යවා ඇති බව දන්වමි. |

**2.2.4** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවෙන් රු. 6,918,751 ක උසාවි දඩ සහ රු. 1,935,683 ක මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | මේ වන විට උසාවි දඩ රු. 3,659,821 ක් සහ මුද්දර ගාස්තු රු. 1,935,683 ක් අයකර ඇති බව දන්වමි. |

**2.3** <u>අධිභාර</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 87,749 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | හිඟ අධිභාර අයකරගත යුතුවේ. | මෙම අධිභාරයට අදාල නඩුව ඇඹිලිපිටිය අධිකරණයෙහි විභාග කරමින් පවතින බව දන්වමි. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** <u>තිරසර සංවර්ධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හදුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | මීට අදාලව කාර්ය මණ්ඩලය පුහුණුකර 2020 වර්ෂය සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට බලාපොරත්තු වන බව දන්වමි. |

**(ආ) ඉටු නොකළ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබුණු අයවැය ලේඛනයේ ඇතුළත් ඇස්තමේන්තු වටිනාකම රු. 50,875,168 ක් වූ කර්මාන්ත 06 ක් ඉටුකර නොතිබුණි. | අයවැය ලේඛනයේ ඇතුලත් කර්මාන්ත ඉටුකළ යුතුවේ. | මුදල් ප්‍රතිපාදන අපේක්ෂා කළ අයුරින් නොලැබුණු බැවින් අදාල කර්මාන්ත ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් නොවන පෞද්ගලික ගොඩනැගිලිවල සභාවේ සේවකයන් නොවන අයට පුස්තකාල 15 ක් පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබුණු රු. 552,437ක් වටිනා පොත් 3050ක් හා රු.210,000ක් වටිනා පොත් රාක්ක 28ක් නැවත සභාවට ලබාගෙන නොතිබුණු අතර මෙම පුස්තකාල දැනට ක්‍රියාත්මකව නොතිබුණි. | පුස්තකාල ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු 2011 වර්ෂයේ දී ආරම්භකර තිබුණු අතර ඒ සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතුවේ. | ඉදිරියේදී පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 02 කට අදාලව සේවකයන් 02 දෙනෙකුගේ අතිරික්තයක් පැවති අතර තනතුරු 03 කට අදාලව පුරප්පාඩු 03 ක් පැවතුණි. | අතිරික්ත කාර්ය මාණ්ඩලයේ තනතුරු අනුමත කරගත යුතු අතර පුරප්පාඩු පුරවාගත යුතුවේ. | අතිරික්ත සංවර්ධන නිලධාරිණිය සෙවනගල කාර්යාලයේ ජල ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති අතර අතිරික්ත පෙර පාසල් පාලිකා තනතුර එම පාලිකාව විශ්‍රාම යාමත් |

| | | |
|---|---|---|
| | | සමඟ අවසන්වේ. මෙතෙක් පුරප්පාඩු සම්පූර්ණ කර නොමැති බව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | -------------- | ------------------- |
| (අ) | සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් 2019 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුල රු. 227,819 ක ඉන්ධන වියදමක් දරා මීටර් පැය 223.6 ක් ධාවනය කර, කර්මාන්ත 30 ක් ඉටුකළ බව දෛනික ධාවන සටහන්වල දක්වා තිබුණි. එහෙත් එම කර්මාන්තවලට අදාලව නිම් වැඩ වාර්තා හා කර්මාන්ත 22 ක් සඳහා ඇස්තමේන්තුද පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු හා නිම් වැඩ වාර්තා පිළියෙල කළ යුතුවේ. | මෙම කර්මාන්ත සඳහා නිම්වැඩ වාර්තා සකස් කර ඇති අතර ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කොට අදාල කර්මාන්ත සිදුකරන බව දන්වමි. |

**3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | -------------- | ------------------- |
| සභා බලප්‍රදේශයේ සභාවට අයත් මාර්ග හඳුනාගෙන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | මාර්ග හා මං මාවත් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කළ යුතුවේ. | දැනට ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් මාර්ග හඳුනා ගනිමින් පවතින අතර එය අවසන් වූ වහාම ගැසට් පත්‍රයේ පල කරන බව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | -------------- | ------------------- |
| (අ) | සභාව විසින් ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයක බොරළු යොදා සංවර්ධනයකර තිබුණු මාර්ග ව්‍යාපෘති 12 කට අදාලව ප්‍රවාහන විෂයය සඳහා ගෙවීම් කිරීමේදී, බොරළු ඝන මීටර් 200 ට අඩු කර්මාන්තවලට අදාල අනුපාත යොදාගෙන | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් කිරීම නිසා, රු. 1,404,751 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ආ) | සෙවනගල සමගිපුර නෙළුම්වැව ජල ව්‍යාපෘතිය සංවර්ධන කිරීමේදී ජලනල එළීම සඳහා කාණු කැපීමේ විෂයයට අදාලව ගෙවීම් කිරීමේදී, ළිං හැරීමට අදාල ගෙවීම් අනුපාතය යොදාගෙන තිබුණු බැවින්, රු. 55,440 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | සභාව විසින් කුලියට ලබාගත් බැකෝ ලෝඩර් යන්ත්‍ර 2ක් යොදාගෙන සිදුකර තිබුණු සුසාන භූමි 4ක් පිළිසකර කිරීමේ කර්මාන්තවලදී, එම බැකෝ ලෝඩර් යන්ත්‍ර 2ක සඳහා නියමිත පැය ගණනට වඩා පැය 40.9 ක් වෙනුවෙන් රු. 96,240 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 2 කට ගෙවීම් කිරීමේදී මාර්ගතලය ජලය යොදා පදම් කිරීමේ වැඩ විෂය ඉටුකර නොතිබියදී ඒ වෙනුවෙන් රු. 43,968 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 3 ක ප්‍රමාණ පත්‍ර හා නිම්වැඩ වාර්තා අනුව මාර්ගයේ උස අඟල් 6 ක් විය යුතු වුවද, භෞතික පරීක්ෂාවේදී එහි උස අඟල් 5ක් වූ බැවින් එකතුව රු. 407,494 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඊ) | මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 3 ක ප්‍රසාරණ මූට්ටු (Constriction Joint) වැඩ විෂයය ඉටුකර නොතිබියදී ඒ වෙනුවෙන් එකතුව රු. 20,832 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවේ. | 2020 ජුනි 01 දින අභ්‍යන්තර විගණකවරයෙක් පත්කර ඇති බව දන්වමි. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------- | -------------- | ------------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටු විය යුතුවේ. | ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. |